# අත්තම්මයි සයුරියි....



Sadilmi Hasmika Keerthirathna

# අත්තම්මයි සයුරියි

සදිල්මි හස්මිකා කීර්තිරත්න.

වෙනත් කෘති **:- දගකාර රෝසි**

පාසල **:- Mahamaya Girls' College**

ඉගෙනුම ලබන පංතිය **:- grade 4**

කෘතිය පළ කරන දිනය **:- 2025.02.08**

978-624-208-418-3

පිදුම....

මා රජ කරවන්නට

වෙහෙස වෙන මාගේ

ආදරණීය

අම්මාට හා

තාත්තාට...

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලිය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිම්පාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "**හෙරණගත්කරණී**" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකමත් එක ගමක
හිටියා සයුරි කියලා
පුංචි ගෑණු ළමයෙක්.
එයාගේ පවුලේ
හිටියේ අම්මයි
තාත්තයි අත්තම්මයි
සයුරියි. සයුරි
වැඩියෙන්ම ආදරේ
කලේ එයාගේ
අත්තම්මට .

සයුරි දවසේ වැඩි වෙලාවක් ගත කළේ අත්තම්මා එක්ක. එයා අත්තම්මා එක්ක ගොඩක් හොඳ වැඩ කරන්න පුරුදු වෙලා හිටියා. උදේ හවස බුදුන් වැන්දා. පුංචි සයුරි සතුන්ට හරිම ආදරෙයි.



වෙනදා වගේම සයුරි
උදෙන්ම නැගිටලා පිරිසිදු
වෙලා කෑම කාලා බුදුන්
වැඳලා පාසල් යන්න පිටත්
වුනා.

වෙනදා වගේම අත්තම්මා
සයුරි නොපෙනී යනකම්ම
වැට ළඟට වෙලා බලාගෙන
හිටියා.

ටික වෙලාවකට පස්සේ
අත්තම්මට පපුවේ
අමාරුවක් හැදුනා.

අම්මා ඉක්මනට අත්තම්මව
ඉස්පිරිතාලෙට අරගෙන
ගියා.

අනේ අත්තම්මා පුංචි සයුරි
දාලා යන්න ගිහින් සයුරි
පාසල් ඇරලා ගෙදර ආවත්
වෙනදා වගේ අත්තම්මා
වැට ළඟ හිටියේ නෑ.



සයුරි අත්තම්මාව ගේ
පුරා හෙව්වා.
එතකොට අම්මා
ඇවිත් සයුරිට කිව්ව
අත්තම්මා අපිව දාල
ගියා කියලා. පුංචි
සයුරි හොඳටම
ඇඬුවා. කෑවෙ
බිව්වෙත් නෑ.

ටික දවසකට පස්සේ සයුරි නිදාගෙන ඉද්දි හීනෙන් අත්තම්මා එයා ළගට ඇවිත් ඇහුවා ," මගේ දුවේ ලස්සන ගමනක් යමුද ?" කියලා .සයුරි ගොඩක් සතුටින් " යමු " කිව්වා.

අත්තම්මා සයුරිත්
එක්ක වළාකුළු අතරින්
ලස්සන ලෝකෙකට
ගියා. එහෙ ලස්සන
සුරංගනාවියන් හිටියා.
එයා මුළු රෑම
අත්තම්මා එක්ක
හිටියේ.



ඊළඟ දවස සයුරි සතුටින් පටන් ගත්තා. මොකද නිදාගත්තම අත්තම්මා එයා ළඟට එන නිසා.

# නිමි.....

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

978-624-208-418-3